පාර්ලිමේන්තුවේ පු...
කොළඹ.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 12 දරන
# ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 පෙබරවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි                                                   තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1980 අංක 12 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 පෙබරවාරි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 54/79.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 12 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනතේ 8 වන වගන්තියෙහි "1972 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු" යන වචන හා ඉලක්කම් වෙනුවට "1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු, එහෙත් 1974 අප්‍රේල් මස 1 වන දින පසු නොවී" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (9) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(9) දායක මුදලේ කාර්තු වාර කොටසක සම්පූර්ණ මුදල හෝ එහි යම් කොටසක් හෝ ගෙවීම් පැහැර හැර ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින්, එසේ ගෙවීම පැහැර හරින ලද මුදලට අමතරව දණ්ඩනයක් වශයෙන්—

(අ) එසේ ගෙවීම පැහැර හරින ලද මුදලේ සියයට පහකට සමාන මුදලක්, ගෙවිය යුතු ය; තව ද

(ආ) ගෙවීම පැහැර හැරීම ආරම්භ වීමෙන් පසු දින තිහක් ඉකුත් වීමට පෙර, ඒ ගෙවීම පැහැර හරින ලද මුදල ගෙවනු නොලැබුවහොත්, එම මුදල ගෙවීම පැහැර හැර තිබෙන වැඩිදුරටත් වූ එක් එක් තිස් දිනක කාලපරිච්ඡේදය හෝ ඉන් යම් කොටසක් වෙනුවෙන්, ගෙවීම පැහැර හරින ලද මුදලේ සියයට එකකට සමාන වැඩිමනත් මුදලක් ගෙවිය යුතු ය :

එසේ වුවද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු සම්පූර්ණ මුදල, කිසිම අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද මුදලින් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය." තව ද

6 — ශ 47634 — 10,700 (80/01)

(ආ) ඒ වගන්තියේ අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(10) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් අත්හැර දැමීම හෝ අඩු කිරීම කරන ලද යම් විශේෂ අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන ඒ මුදල අත්හැර දැමීමක් හෝ අඩු කිරීමක් සාධාරණ සහ යුක්ති සහගත බවට තමා සෑහීමට පත් වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එසේ අත්හැර දැමීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකි ය.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16 වන වගන්තියට කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින බලාත්මක වූ ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒ සංශෝධනය, ඒ දින හෝ ඉන් පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ම අදාළ වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ගෙවන ලද දායක මුදල් වෙනුවෙන් සහතික නිකුත් කිරීම.

42. (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින්—

(i) 1973 අප්‍රේල් මස 30 වන දිනයෙන් අවසාන වන මාස දොළහක් වූ කාලපරිච්ඡේදය තුළ;

(ii) 1974 ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන මාස දොළහක් වූ කාලපරිච්ඡේදය තුළ; සහ

(iii) යම් තදනන්තර වර්ෂයක ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන මාස දොළහක් වූ කාලපරිච්ඡේදය තුළ

සෑම තැනැත්තකු විසින් ම ගෙවන ලද දායක මුදල් වෙනුවෙන් හෝ සෑම තැනැත්තකුගෙන් ම අය කර ගන්නා ලද දායක මුදල් වෙනුවෙන් හෝ ඒ තැනැත්තා වෙත, ඒ එක් එක් කාලපරිච්ඡේදය තුළ ඔහු විසින් ගෙවන ලද හෝ ඔහුගෙන් අය කර ගන්නා ලද මුළු දායක මුදල දක්වන සහතිකයක් නිකුත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, 1973 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වී 1974 ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය තුළ යම් තැනැත්තකු විසින් ගෙවන ලද හෝ යම් තැනැත්තකුගෙන් අයකර ගන්නා ලද යම් දායක මුදලක්, 1074 ජූනි මස 30 වන දිනයෙන් අවසාන

වන මාස දොළහක් වූ කාලපරිච්ඡේදය තුළ ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ ලෙස හෝ ඒ තැනැත්තාගෙන් අය කරගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"දායක මුදල් වෙනුවෙන් පොලිය.

44. 42 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක සඳහන් මුදල, එම සහතිකය නිකුත් කරන ලද්දේ යම් මාස දොළහක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ද, ඒ මාස දොළහේ කාලපරිච්ඡේදයේ අවසාන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාලපරිච්ඡේදය තුළ තැන්පත්ව පැවතියේ නම්, ඒ මුදල වෙනුවෙන් පොලිය ගෙවනු ලැබිය යුතු ය. සහතිකය නිකුත් කරන ලද්දේ යම් මාස දොළහක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ද, ඒ මාස දොළහේ කාලපරිච්ඡේදයේ අවසාන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් ආරම්භ වන පළමුවන වර්ෂ දෙක වෙනුවෙන් සියයට පහක ප්‍රමාණය අනුව ද, තදනන්තර වර්ෂ වෙනුවෙන් සියයට පහක ප්‍රමාණය අනුව ද පොලිය ගෙවනු ලැබිය යුතු ය.".